**ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂකදෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ආණ්ඩුවේ රස පරීක්ෂකදෙපාර්තමේන්තුවේ2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රස පරීක්ෂකදෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවටඅදාළවාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි14දිනගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවපාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑමහැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආණ්ඩුවේ රස පරීක්ෂකදෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකිම**

**-----------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.22,960,315 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව එය රු.25,560,841 වූයෙන් රු.2,600,526 කවෙනසක් විය. | පරිසනක පද්ධතියට වත්කම් මිලදී ගැනීම් පිළිබඳ කේවල තොරතුරු උඩුගත කිරීමේ දෝෂයකින් 2020 දෙසැම්බර් මිලදීගත් වත්කම්වල විස්තර භාණ්ඩාගාර ආකෘතියේදී දක්වා ඇති වටිනාකම අඩුවෙන් පෙන්වයි. | මූල්‍ය නොවන වත්කම් වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

### 1.6.2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වත්කම් 04 ක සමාලෝචිත වර්ෂයේආරම්භක ශේෂයන් සහ භාණ්ඩාගාර ගිණුම් අනුවඑදිනට පවතින එම ශේෂයන් අතර රු.12,807,492 ක නොසැසඳීම් පැවතිණි. | භාණ්ඩාගාර ආකෘතිය සඳහා පදනම් කරනු ලබන New Cigasවැඩසටහනෙහි දැනට තිබෙන වත්කම් ශේෂයන්වල වටිනාකම වැඩිවන ස්වභාවයේ මිලදී ගැනීම් සහ ආරම්භක ශේෂයන් ගිණුම්ගත කිරීම සටහන් වන්නේ ආරම්භක ශේෂයේ වැඩිවීම ලෙසයි. වර්ෂය තුළ මිලදී | භාණ්ඩාගාර ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශන අතර පවතින වෙනස්කම් නිවැරදි කළ යුතුවේ. |

ගැනීම්වල නියම වටිනාකම් ගිණුම් සාරාංශ මඟින් ගිණුම්ගත වන බැවින්, වත්කම්වල අවසාන ශේෂය ACA – 6 අකෘතිය මෙන්ම SA 82 ගිණුම් ප්‍රකාශයෙන් නිවැරදිව පෙන්නුම් කරයි.

### 1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයඅවසානයට අය වියයුතු ණය ශේෂයට අදාලව භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර පවතින රු.20,660 ක වෙනස වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබුණි. | මෙම වෙනස පොත්වලින් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2018.09.01 දින අධිකරණ අමාත්‍යාංශ ලේකම් මඟින් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා තිබුණද, පොත්වලින් කපා හැරීමක් සිදුකර නොමැත. | ගිණුම් අතර පවතින වෙනස්කම් නිවැරදි කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 10.1 ඡේදයට අදාල මාර්ගෝපදේශ 3.4 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්බැඳීම් හා බැරකම් ශේෂ භාණ්ඩාගාරයේ එක් එක් වියදම් ශිර්ෂවල බැඳීම් හා බැරකම් ශේෂ සමඟ සැසඳී තිබිය යුතු වුවත් එම ශේෂයන් අතර නොසැසඳීම් රු.236,309 ක්විය. | භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල SA 92 යටතේ දක්වා ඇත්තේ මුදල් රෙගුලාසි 94(I) ප්‍රකාරව ඇති කර ගන්නා ලද බැඳීම් පමණි. එහෙත් බැඳීම් හා බැරකම් ප්‍රකාශය මුදල් රෙගුලාසි 94(II) ප්‍රතිපාදන යටතේ එළඹෙන ලද බැඳීම්ද ඇතුළත් කොට සකස් කළ යුතුවේ. | චක්‍රලේඛයප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | භාණ්ඩාගාරයට වාර්තා නොකල කිසිදු බැඳීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදම් ලෙස නිරවුල් නොකල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස වාර්තා නොකළ රු.333,809 ක් 2021 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | සේවා ගිවිසුම 2021 වර්ෂය සඳහා වලංගු වන පරිදි අත්සන් කොට ඇති බැවින් බැරකමක් ලෙස ඇතුළත් නොකරන ලදි. අනෙකුත් වවුචර් විස්තර තවදුරටත් සොයා බලමින් පවතී. | චක්‍රලේඛයප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති රෙගුලාසි වලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසිසංග්‍රහයේ අංක 571දරන මුදල් රෙගුලාසිය | කල් ඉකුත් වූ රු.25,931 කතැන්පත් ශේෂ 02 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම මේ වන විට ආරම්භ කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව සතු වාහන 24 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | 2021 වර්ෂය වෙනුවෙන් වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරවකටයුතු කළ යුතුවේ. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය නිමකල විගස ලබාගත් අතුරු අග්‍රිම පිය වියයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලබාදුන් රු.25,000 ක අතුරු අග්‍රිම දින 333 ක ප්‍රමාදයකින් පසු පියවා තිබුණි. | අංක 03/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සුළු මුදලින් එකවර ගෙවීමේදී රු.5,000 සීමාව ඉක්මවා නොමැති අතර මෙම වියදම් හදිසි මිලදී ගැනීම් සඳහා වෙන් කර ඇති අත්තිකාරමෙන් ගෙවා ඇති වියදමකි. | චක්‍රලේඛයප්‍රකාරව අත්තිකාරම් පියවිය යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට නඩු කටයුතු සඳහා විශේෂඥ වාර්තා ලබාදීමට නොහැකි වූ ප්‍රමාණය14,171 ක් විය.වර්ෂයට අදාල කැඳවූ 35,191 ක් ද ඇතුළුව වාර්තා 34,689 ක් ලබාදී අවසන් කලද තවත් වාර්තා 14,673 ක් ලබාදීමට ඉතිරි වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කැඳවා තිබූ වාර්තා වලින් ලබා දීමට නොහැකි වූ ප්‍රමාණය සියයට 41.69 ක් විය. | විශ්ලේෂණය සඳහා ඉදිරිපත් වන සාම්පල් ප්‍රමාණය වර්ෂය තුළ සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවන නමුත් විශ්ලේෂණ කටයුතු සඳහාඅවශ්‍ය කාර්ය මණ්ඩලය, වර්ෂ ගණනාවකින් බඳවා ගැනීමට නොහැකි වීම මත මෙම තත්ත්වය ඇති වී ඇත. මේ වන විට සහකාර රස පරීක්ෂකවරුන් 28 දෙනෙකු බඳවාගෙන ඇති අතර එකතු වී ඇති සාම්පල් විශ්ලේෂණය කිරීම සඳහා වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක වන බැවින් ඉදිරියේදී මෙම තත්ත්වය මගහරවා ගැනීමට අපේක්ෂිතය. | වාර්ෂික නඩු වැඩිවීමේ සහ නඩු වාර්තා ලබාදීමේ ප්‍රවනතාවයට සාපේක්ෂව වාර්තා නිකුත් කිරීම් වැඩි කිරීමේ ක්‍රමවේදයන් හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුවේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ හා තෘතීයික මට්ටමේ පුරප්පාඩු 31 ක් විය. | එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් සිටී. | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍යව පවතින පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. |